11-02-2026 උදෑසන මුරලි ඕම් ශාන්ති බාප්දාදා මධුබන්

**සාරය:** සුමිහිරි දරුවනි, මෙම වඩාත්ම ශුභදායක වූ සංගම යුගයේ පිවිතුරු වන්න, එවිට ඔබට දිව්‍යලෝකයේ උරුමය හිමි වෙයි යන පරමාත්ම පියාගේ මෙම නියෝගයේ පණිවිඩය, සෑම කෙනෙකුටම ලබා දෙන්න.

**ප්‍රශ්නය:** ඔබ සෑම කෙනෙකුටම කිව යුතු පහසු ගනුදෙනුව කුමක්ද?

**පිළිතුර:** මෙම අවසන් උපතේදී පරම පියාගේ උපදෙස් පිළිපැද පිවිතුරු වන්න, එවිට ඔබට උපත් 21කට ලෝක ආධිපත්‍යය හිමි වෙයි. මෙය කිරීමට ඉතාමත්ම පහසු ගනුදෙනුවකි. සෑම කෙනෙකුටම මෙම ගනුදෙනුව සිදුකරන අන්දම කියා දෙන්න. ඔවුන්ට පවසන්න: දැන් ශිව බාබා සිහිපත් කර පිවිතුරු වන්න, එවිට ඔබ පිවිතුරු ලෝකයේ අධිපතියන් වෙයි.

ඕම් ශාන්ති. ඔබ ප්‍රදර්ශන සහ මේලාවන්හිදී (හමුවීම්), රූපරාමු හෝ පිංතූර විස්තර කිරීමෙන්, ඔවුන්ගේ අසීමිත උරුමය, පරමාත්ම පියාගෙන් හිමි කර ගත යුතු බව, ඔබ මිනිසුන්ට විස්තර කළ යුතුය යන්න, ආධ්‍යාත්මික පියා ඔබට විස්තර කර දෙන බව ඔය ආධ්‍යාත්මික දරුවන් දන්නවා. කුමන උරුමයද? මනුෂ්‍යයන් දේවතාවන් වන අන්දම සහ චක්‍රයෙන් භාගයකට ඔවුන්ගේ දෙව්ලොව රාජධානියේ උරුමය, අසීමිත පියාගෙන් හිමි කර ගත හැකි අන්දම ඔබ විස්තර කළ යුතුයි. පරම පියා, ව්‍යාපාරිකයා වන අතර, ඔබ මෙම ගනුදෙනුව ඔහු සමඟ සිදුකළ යුතුයි. දේවතාවන්, පිවිතුරු බව මිනිසුන් දන්නවා. භාරතයේ එය ස්වර්ණමය යුගය වූ කල්හි, දේවතාවන් පාරිශුද්ධ විය. ඔවුන් දිව්‍ය ලෝකය සඳහා අනිවාර්යයෙන්ම යමක් ලබා ගන්නට ඇති. දිව්‍ය ලෝකය ස්ථාපිත කරන පරමාත්ම පියාට පමණයි ඔබට ප්‍රතිලාභයක් ලබා ගැනීමට මඟ පෑදිය හැක්කේ. අපවිත්‍ර අයව පිවිතුරු කර, ඔවුන්ට පිවිතුරු ලෝකයේ රාජධානිය ලබා දෙන්නේ, පාරිශුද්ධකරු පියා පමණයි. ඔහු ඔබට බොහෝ පහසු ගනුදෙනුවක් පිළිගන්වයි! ඔහු සරළව පවසන්නේ මෙයයි මෙය ඔබගේ අවසන් උපතයි. මා මෙහි සිටින අතර, පිවිතුරු වන්න. මා පැමිණියේ ඔබව පිවිතුරු කරන්නයි. මෙම අවසන් උපතේ පිවිතුරු වීමට උත්සාහ දරන්න, එවිට ඔබ පිවිතුරු ලෝකයේ උරුමය හිමි කරගනීවි. මෙම ගනුදෙනුව ඉතා පහසුයි. පරමාත්ම පියාගේ නියෝගය මෙය බව, දරුවන් විස්තර කළ යුතුයි, යන සිතිවිල්ල බාබාට ඇති විය පිවිතුරු වන්න! ඔබ පිවිතුරු විය යුතු වඩාත්ම ශ්‍රේෂ්ඨ සංගම යුගය මෙයයි. වඩාත්ම ශ්‍රේෂ්ඨ ජීවයන් වන්නේ දේවතාවන්ය. ලක්ෂ්මි සහ නාරායනගේ රාජධානිය පැවතුනි. ඔබ පරම පියාගේ උපදෙස් වලට අනුව, මෙම අවසන් උපතේදී පිවිතුරු වුවොත් පමණයි, ඔබට පියාගෙන් උරුමයක් ලෙස, දේවතා ලෝක ආධිපත්‍යය හිමි කරගත හැකි වන්නේ. ඔහු ඔබට යෝගා බලයෙන් තමෝප්‍රධාන් බවින් සතෝප්‍රධාන් විය හැකි අන්දම පෙන්වා දෙයි. යහපත ගෙන ඒම උදෙසා ඔය දරුවන් යමක් වැය කළ යුතුයි. කිසි දෙයක් වැය නොකර, රාජධානියක් ස්ථාපිත කළ නොහැක. ලක්ෂ්මි සහ නාරායනගේ රාජධානිය, දැන් ස්ථාපිත කෙරෙනවා. ඔය දරුවන් අනිවාර්යයෙන්ම පිවිතුරු විය යුතුයි. ඔබගේ සිතිවිලි, වචන හෝ ක්‍රියා වලින් කිසිම වැරදි ක්‍රියාවක් සිදු කරන්නට එපා. දේවතාවන්ට කිසිම විටෙක නරක සිතිවිලි ඇතිවන්නේ නැත. ඔවුන්ගේ මුවින් ඔවුන් කිසිම විටෙක නරක වචන පවසන්නේ නැත. ඔවුන් සියලුම ගුණධර්ම වලින් සපිරි, මුළුමනින්ම පාපයෙන් තොර, උසස්ම විනය නීතීන් පිළිපදින, ශ්‍රේෂ්ඨතම මානව ජීවයන්ය. හිඳ, නැතිව ගිය අයගේ ප්‍රශංසා ගායනා කෙරෙයි. මා දැන් ඔය දරුවන්ව එම දේවතාවන් බවට පත් කරවීමට පැමිණ සිටියි. එබැවින් ඔබගේ සිතිවිලි, වචන හෝ ක්‍රියා වලින් කිසිම නරක ක්‍රියාවක් සිදු නොකළ යුතුයි. දේවතාවන් සම්පූර්ණයෙන්ම පාපයන්ගෙන් තොරයි. මෙම මරණීය දේශයේ ඔබගේ අවසන් උපත මෙය වන බැවින්, ඔබට මෙම ගුණධර්ම දැන් ධාරණය කරගත හැක. අපවිත්‍ර ලෝකයට, මරණීය දේශය යැයිද, පිවිතුරු ලෝකයට, අමරණීය දේශය යැයිද කියයි. මරණීය දේශයේ විනාශය දැන් ඔබ ඉදිරියේ ඇත. අමරණීය දේශය දැන් නිසැකයෙන්ම ස්ථාපිත කළ යුතුයි. මෙය, ශාස්ත්‍රයන්හි පෙන්වා දී ඇති, පැරණි දූෂිත ලෝකය විනාශ වූ, එම මහාභාරත යුද්ධයමයි. කෙසේවෙතත්, කිසිවෙකුට මෙම ඥානය නොමැත. පරම පියා පවසන්නේ සෑම කෙනෙක්ම අවිද්‍ය නින්දේ පසුවෙයි. ඔවුන් පාපයන් පසෙන් කුල්මත්ව සිටියි. පරමාත්ම පියා පවසන්නේ දැන් පිවිතුරු වන්න! ඔබ අධිපති දෙවියන් වනවා නේද? ලක්ෂ්මි සහ නාරායනට දේවතාවියක් සහ දේවතාවක් යැයි කියයි, එනම්, ඔවුන්ගේ උරුමය ඔවුන්ට ලැබුණේ පරමාත්ම දෙවියන්ගෙනි. භාරතය දැන් අපවිත්‍රයි. සෑම කෙනෙකුගේ සිතිවිලි, වචන සහ ක්‍රියා එවැනිය. යමක් පළමුව බුද්ධියට ඇතුළු වී, ඉන්පසුව වචන වලින් පිටවෙයි. ඒවා ක්‍රියාවට නැඟෙන විට, එම ක්‍රියා, පාපකාරී වෙයි. පරම පියා පවසන්නේ එහි පාපකාරී ක්‍රියා නැත. මෙහි පාපකාරී ක්‍රියා තිබෙන්නේ, මෙය

රාවණගේ රාජධානිය නිසාය. පියා පවසන්නේ ඔබගේ ජීවිතය පුරාවටම පිවිතුරුව සිටින්න! ඔබ පාරිශුද්ධව රැඳී සිට, ඔබගේ බොහෝ උපත් වල පාපයන් කපා දමන්නට හැකි වන සේ ඔබගේ බුද්ධිය මා සමඟ යෝගාවේ සම්බන්ධ කිරීමට ඔබ පොරොන්දු විය යුතුයි. එවිට පමණයි ඔබ උපත් 21 කට දිව්‍ය ලෝකයේ අධිපතියන් වන්නේ. පරමාත්ම පියා මෙය පිළිගන්වයි. මෙම කෙනාගේ මාර්ගයෙන් පරමාත්ම පියා ලබා දෙන උරුමය මෙය බව, එම කෙනා පහදා දෙයි. එම කෙනා ශිව බාබා වන අතර මෙම කෙනා දාදාය. අපට සෑම විටම බාප්දාදා යැයි කියන්නේ මේ නිසයි ශිව බාබා සහ බ්‍රහ්ම දාදා. පරම පියා ඔබට එවන් ගනුදෙනුවක් පිළිගන්වයි! මරණීය දේශයේ විනාශය ඔබ ඉදිරියේ තිබේ. අමරණීය දේශය ස්ථාපිත කෙනෙරවා. භාරතයේ ජනතාවට යහපතක් සිදු කිරීමට ප්‍රදර්ශන සහ මේලාවන් පිළියෙල කෙරෙනවා. පරමාත්ම පියා පැමිණ, භාරතයේ රාම (දෙවියන්) රාජධානිය ස්ථාපිත කරයි. පියා පවසන්නේ දරුවනි, විශාලතම සතුරා වන්නේ රාගයයි. මෙම පාපයන් පහට, මායා යැයි කියයි. ඒවා ජය ගැනීමෙන් ඔබ ලොව ජයගත්තන් වෙයි. දේවතාවන්, ලොව ජයගත් අයයි. වෙනත් කිසිම කෙනෙකුට ලෝකය ජය ගත නොහැක. ක්‍රිස්තියානුවන් එකමුතු වූයේ නම් ඔවුන්ට මුළු ලෝකයේම රාජධානිය හිමි කරගත හැකි බව, පරම පියා විස්තර කරදෙයි. කෙසේවෙතත්, එය නීතිය නොවෙයි. එම බෝම්බ තිබෙන්නේ පැරණි ලෝකය විනාශ කිරීමටයි. සෑම චක්‍රයකදීම ලෝකය, අළුත් බවින් පැරණි වී, පැරණි බවින් අළුත් වෙයි. නව ලෝකයේ, රාමාගේ රාජධානිය ලෙස හැඳින්වෙන, දෙවියන්ගේ රාජධානිය තිබේ. පරමාත්ම දෙවියන් කවරෙක්ද කියා නොදන්නා නිසා, ඔවුන් දිගින් දිගටම රාමාගේ නම ජප කරයි. ඔය දරුවන් මෙම දේවල් ධාරණය කරගත යුතුයි. උපත් 84 ක් තුළදී, අපි සැබවින්ම සතෝප්‍රධාන් බවින් තමෝප්‍රධාන් විය යුතුව තිබුණා. දැන් අපි අනිවාර්යෙන්ම නැවත සතෝප්‍රධාන් විය යුතුයි. ශිව බාබා ඔබට උපදෙස් ලබා දී ඇති අතර, ඒවා පිළිපැදීමෙන් උපත් 21 කට ඔබ පිවිතුරු ලෝකයේ උසස් තත්ත්වයක් හිමි කරගනී. දැන්, ඔබ සිහිපත් කිරීමේ සිට, වෙනත් අයට මාර්ගය පෙන්වන්නේද නැද්ද යන්න, ඔබට අයත් දෙයකි. ප්‍රදර්ශන තුළින් ඔය දරුවන් බොහෝ මිනිසුන්ට මාර්ගය පෙන්වනවා. ඔබ තමන්ටද යහපතක් සිදු කළ යුතුයි. මෙම ගනුදෙනුව ඉතා පහසුයි. මෙම අවසන් උපතේ පිවිතුරුව සිටීමෙන්, ශිව බාබාගේ සිහි කිරීමේ සිටීමෙන්, ඔබ තමෝප්‍රධාන් බවින් සතෝප්‍රධාන් වෙයි. මෙම ගනුදෙනුව බොහෝ පහසුයි! මුළු ජීවිතයම වෙනස් වෙයි. ඔබ මේ අන්දමින් සිතිය යුතුයි. සමහර දරුවන් 'රාඛි' බඳින්නට ගිය විට, ලෝකය තමෝප්‍රධාන්ව තිබෙන මෙකල, පිවිතුරුව රැඳී සිටීම කිසිසේත් කළ නොහැක්කක් බව කෙනෙක් කී බව, පියාට අසන්නට ලැබුණා. එය දැන් සංගම යුගය බවවත් එම අසරණ දුප්පත් අය නොදනී. ඔබව පිවිතුරු කරන්නේ පරමාත්ම පියා පමණයි. ඔබගේ උදව්කරු, උත්තරීතර පියා, උත්තරීතර ජීවාත්මයයි. මෙහි ලබා දෙන ආකර්ෂණය කෙතරම් විශාලද කියාවත් ඔවුන්ට වැටහෙන්නේ නැත! පාරිශුද්ධත්වයට පත්වීමෙන් ඔබ පිවිතුරු ලෝකයේ අධිපතියන් බවට පත් වෙයි. පරම පියා පවසන්නේ පාපයන් පහ වන මායා පරාජය කිරීමෙන් ඔබ ලෝකය ජයගනී. එබැවින් ඔබ පිවිතුරු නොවිය යුත්තේ මන්ද? මෙය නොම්මර එකේ ගනුදෙනුවකි. පියා පවසන්නේ විශාලතම සතුරා, රාගයයි. මෙය පරාජය කිරීමෙන් ඔබ පිවිතුරු වෙයි. මායා පරාජය කරන අය, ලෝකය ජයගනී. මෙය යෝගා බලයෙන් මායා පරාජය කිරීම පිළිබඳ කාරණාවකි. පැමිණ ජීවාත්මයන්ට පහදා දෙන්නේ උත්තරීතර පියා, උත්තරීතර ජීවාත්මය පමණයි මා සිහිපත් කරන්න එවිට මිශ්‍ර වී ඇති ලෝහ ඉවත් වෙයි. එවිට ඔබ සතෝප්‍රධාන් ලෝකයේ අධිපතියන් වෙයි. පරම පියා සංගම යුගයේදී ඔබට ඔබගේ උරුමය ලබා දෙයි. වඩාත්ම ශ්‍රේෂ්ඨ ජීවයන් වූයේ ලක්ෂ්මි සහ නාරායනය. උසස්ම විනය නීතීන් පිළිපදින එමෙන්ම දේවතා ධර්මයට අයත්, වඩාත්ම ශ්‍රේෂ්ඨ ජීවාත්ම ලෙස හැඳින්වෙන්නේ ඔවුන් පමණයි. සෑම දෙයක්ම ඔබට ඉතා හොඳින් විස්තර කෙරෙන නමුත් ඇතැම් විට මෙම කරුණු අමතක වෙයි. පසුව ඔබගේ දේශනය අවසන් වූ පසු, ඔබ ඇතැම් කරුණු විස්තර නොකළ බව, ඔබට සිහිවෙයි. ඔබට විස්තර කළ හැකි කරුණු බොහෝ තිබේ. එය ඒ අන්දමින් සිදුවනවා. නීතිඥයින්ටද ඇතැම් විට කරුණු අමතක වෙනවා. එවිට ඔවුන්ට පසුව කරුණක් මතක් වූයේ නම්, ඔවුන් නැවත නඩුව ආරම්භ කරයි. වෛද්‍යවරුන්ටද එය එසේය. යම් කිසි රෝගයකට යම් ඖෂධයක් හොඳ වන ආකාරය ගැන ඔවුන් සිතයි. මෙහිද ඔබට බොහෝ කරුණු තිබේ. බාබා පවසන්නේ මා අද ඔබට ගැඹුරු කරුණු පහදා දෙනවා. කෙසේවෙතත්, මෙම දේවල් වටහා ගත යුතු සියලු දෙනා, අපවිත්‍රයි. ඔවුන් පවසන්නේ අහෝ පාරිශුද්ධකරුවාණනි! එවිට ඔබ ඔවුන්ට යමක් කී විට ඔවුන් අසහනයට පත් වෙයි. ඔවුන් දෙවියන් ඉදිරියේ සත්‍යය පවසයි අහෝ පාරිශුද්ධකරුවාණනි, පැමිණෙන්න! පැමිණ අපව පිවිතුරු කරන්න! ඔවුන්ට පරමාත්ම දෙවියන්ව අමතක වී ඔවුන් බොරු පවසයි, මේ නිසයි සර්පයා මිය යන නමුත් මුගුර නොකැඩෙන අයුරින් ඔබ උපක්‍රමශීලීව ඔවුන්ට විස්තර කළ යුත්තේ. පරම පියා පවසන්නේ මීයෙකුගෙන් ගුණධර්මයක් අහුලා ගන්න මීයෙක් ඔබව කෙතරම් දක්ෂ අන්දමකින් සපා කයිද යත්, ඔබගෙන් රුධිරය වහනය වුවද ඔබට එය

නොදැනෙයි. මේ සියලුම කරුණු ඔය දරුවන්ගේ බුද්ධිය තුළ තිබිය යුතුයි. යෝගාවේ සිටින අයට නිසි වෙලාවට උදව් ලැබෙයි. මෙම ඥානය පවසන අයට වඩා, මෙම ඥානය ලැබෙන අයට පියා වැඩියෙන් සෙනෙහස දැක්වීම, සිදු විය හැකි දෙයකි. එවිට, පියාම අසුන්ගෙන ඔවුන්ට විස්තර කර දෙයි. පිවිතුරු වීම හොඳ බව ඔවුන්ට දැනෙන එවන් අන්දමට, ඔවුන්ට විස්තර කරන්න. මෙම එක් උපතෙදී පිවිතුරුව සිටීමෙන් ඔබ උපත් 21 කට පිවිතුරු ලෝකයේ අධිපතියන් බවට පත්වෙයි. පරමාත්ම දෙවියන් පවසයි මෙම අවසන් උපතෙදී පාරිශුද්ධ වන්න, එවිට නාටකයේ සැලසුමට අනුව උපත් 21 කට ඔබට උරුමයක් හිමි කරගැනීමට හැකි බව මා සහතික වන්නෙමි. ඔබ සෑම චක්‍රයකදීම මෙම උරුමය හිමි කරගන්නවා. සේවය කිරීමට උනන්දුවක් දක්වන අයට තමන් ගොස් විස්තර කළ යුතු බව හැඟෙයි. මෙය කිරීමට ඔබ සෑම තැනකටම දිව යා යුතුයි. ඥානයේ මහා සයුර වන්නේ පරමාත්ම පියාය. ඔහු බොහෝ සෙයින් මෙම ඥානය අඛණ්ඩව වස්සවයි! පිවිතුරු ජීවාත්මයන්ට මෙය ධාරණය කරගැනීමට හැකි වෙයි. ඔවුන්ගේ නාමයන් කීර්තිමත් වෙයි. ප්‍රදර්ශන සහ මේලාවන්හිදී කෙනෙක් කුමන අන්දමේ සේවයක් කරන්නේද කියා ඔබට කිව හැක. ඇතැම් අය විස්තර කරන්නේ කෙසේද කියා, ගුරුවරුන් ගොස් බැලිය යුතුයි. සාමාන්‍යයෙන් ලක්ෂ්මී සහ නාරායනගේ පිංතූරය මෙන්ම ඉනිමගේ පිංතූරය විස්තර කිරීම ඉතා හොඳයි. ඔබ යෝගා බලය තුළින් ලක්ෂ්මී සහ නාරායන මෙන් වනවා. ලක්ෂ්මී සහ නාරායන, ආදි දේව් සහ ආදි දේවිය. අත් සතරක් ඇති පිළිරුවේ, ලක්ෂ්මී සහ නාරායන යන දෙදෙනාම ඇතුලත්ය. අත් දෙකක් ලක්ෂ්මීගේ වන අතර දෙකක්, නාරායනගේය. භාරතයේ ජනතාවට මෙයවත් වැටහෙන්නේ නැත. මහා ලක්ෂ්මීට අත් සතරක් ඇත. මින් අදහස් වන්නේ ඇය, යුවළක් පෙන්නුම් කරන බවයි. විෂ්ණුටද අත් සතරක් තිබේ. ප්‍රදර්ශන වලදී සෑම දිනකම විස්තර කෙරෙනවා. රථයද පෙන්වා ඇත. ඔවුන් පවසන්නේ අර්ජුන රථයක අසුන්ගෙන සිටි බවත් ඔහුගේ රථය පදවන්නා වූයේ ක්‍රිෂ්ණා බවත්ය. ඒ සියල්ලම ගොතන ලද කතාය. මේවා දැන් ඥානයේ කරුණුය. ඔවුන්, ඥානය නමැති අමෘතයේ පුන්කලස, ලක්ෂ්මීගේ හිස මත පෙන්වා ඇත. ඇත්ත වශයෙන්ම ඥානය නමැති අමෘතයේ පුන්කලස තබන්නේ, පසුව ලක්ෂ්මී බවට පත්වන, ජගත් මාතාවගේ (ජගදම්බා) හිස මතයි. මෙයත් විස්තර කළ යුතුයි. ස්වර්ණමය යුගයේ මිනිසුන් එක් ධර්මයකට අයත් වන අතර ඔවුන්ට එක් මතයක් ඇත දේවතාවන්ට තිබෙන්නේ එක් මතයකි. දේවතාවන් හැර වෙනත් කිසිවෙකුට උසස් යැයි නොකිව යුතුයි. මිනිසුන්ට වටහාගැනීමට හැකි වන පරිදි වචන අඩු ප්‍රමාණයක් තිබිය යුතු බව, බාබාට සිතුණි. මෙම අවසන් උපතෙදී, පාපයන් පහ ජයගැනීමෙන් ඔබ රාමාගේ රාජධානියේ පාලකයන් බවට පත් වෙයි. මෙය ලාභදායි ගනුදෙනුවකි. පරමාත්ම පියා පැමිණ අවිනාශී ඥානයේ මිණි මුතු දන් දෙයි. පියා ඥානයේ මහා සාගරය වන අතර ඔබට ඥානයේ මිණි මුතු ලබා දෙන්නේ ඔහු පමණයි. ඉන්ද්‍රාගේ සභාවේ සුරංගනාවන් (පුක්රාජ්, සබාජ් ආදීන්) සිටියි ඔවුන් සියල්ලම උදව්කරුවන්ය. විවිධ මාදිලියේ මැණික් තිබේ. ඔවුන් මැණික් නවයක් පෙන්වා ඇත්තේ ඒ නිසාය. හොඳින් ඉගෙන ගන්නා අය, එවන් තත්ත්වයක් ලබා ගන්නා බව සත්‍යයකි සෑම කෙනෙක්ම අංකානුරූපයි. උත්සාහ දැරීමට ඇති කාලය, මෙයයි. පරම පියාගේ මාලාවේ පබුළු වන්නේ ඔය දරුවන් බව, ඔබට වැටහෙයි. ඔබ ශිව බාබාව වැඩියෙන් සිහිපත් කරන තරමට, ඔබ සිහිපත් කිරීමේ වන්දනා ගමනේ වඩාත් ඉදිරියට දිව යන තරමට, වඩා වේගයෙන් ඔබගේ පාපයන් දුරු වී යනු ඇත. මෙම ඉගෙනුම සංකීර්ණ නැත. ඔබට ඇත්තේ පිවිතුරුව සිටීමට පමණයි. ඒ සමඟම ඔබ දිව්‍යමය ගුණධර්මද ධාරණය කළ යුතුයි. ඔබගේ මුවින් කිසි විටෙක ගල් මතු නොවිය යුතුයි. ගල් විසි කරන අය, ගල් බුද්ධි ඇති අය වෙයි. තම මුවින් ඥානයේ මිණි මුතු මතු වන අය පමණයි, උසස් තත්ත්වයක් හිමි කරගන්නේ. මෙය ඉතා පහසුයි. පාරිශුද්ධකරු, සියල්ලට විමුක්තිය සහ ජීවන-මුක්තිය පිරිනමන්නා, උත්තරීතර පියා, උත්තරීතර ජීවය වන ශිවා, මෙසේ පවසන බව, ශිෂ්‍යයන්ට පහදා දෙන්න ඕ භාරතයේ ජනතාවනි, ආධ්‍යාත්මික දරුවනේ, මෙම රාවණගේ රාජධානියේ, මරණීය දේශයේ, කලි යුගයේ, ඇති ඔබගේ මෙම අවසන් උපතේ, පාරිශුද්ධව සිටීමෙන්, උත්තරීතර පියා, උත්තරීතර ජීවාත්මය සමඟ බුද්ධියේ යෝගා බලයේ වන්දනා ගමන තුළින් ඔබ තමෝප්‍රධාන් බවින් සතෝප්‍රධාන් වෙයි. ඔබට නැවත වරක්, ඔබ වසර 5000 කට පෙර කළ එම ආකාරයෙන්ම, සතෝප්‍රධාන් ස්වර්ණමය යුගයෙදී දේවතා ස්ව-ආධිපත්‍යයේ ස්ථිතිය එනම්, සම්පූර්ණ පාරිශුද්ධත්වය, සාමය සහ සමෘද්ධිය ලබා ගැනීමට හැකි වෙයි. කෙසේවෙතත්, පියා අපට උගන්වා අපගේ උරුමය ලබා දෙන්නේ, සැබෑ මහා විනාශය සිදුවීමට පෙරයි. ඔබ වැඩියෙන් ඉගෙන ගන්නා තරමට, ඔබ හිමි කරගන්නා තත්ත්වය උසස් වෙයි. ඔහු අපව ඔහු සමඟ ආපසු රැගෙන යනු ඇත. එබැවින් අපි මෙම පැරණි ශරීර සහ පැරණි ලෝකය ගැන සැලකිලිමත් නොවිය යුතුයි. ඔබට පැරණි ලෝකය අත්හැර යාමට දැන් කාලයයි. ඔබගේ බුද්ධිය මෙවන් කරුණු ආවර්ජනය කරන්නේ නම් එය ඉතා හොඳය. උත්සාහ දැරීමෙන් ඔබ දියුණු වී, ඔබ හුස්ම හිර කර නොගන්නා කාලයක් පැමිණෙයි. ලෝකය විනාශ වීමට ඉතා ආසන්න බව ඔබට

දැක ගත හැක. එබැවින් අප අපගේ බුද්ධි, යෝගාවේ සම්බන්ධ කළ යුතුයි. සේවය කිරීමෙන් ඔබට උපකාර ලැබෙයි. ඔබ වෙනත් අයට සතුටෙහි මාවත වැඩියෙන් පෙන්වන තරමට, ඔබ වැඩියෙන් සතුට අත්විඳිනු ඇත. ඔබ අඛණ්ඩව උත්සාහ දරයි. ඔබට ඔබගේ භාග්‍යය දැකිය හැක. පරමාත්ම පියා ඔබට උත්සාහ දරන අන්දම පෙන්වා දෙයි. ඇතැමුන් මෙහි කාර්ය බහුල වන අතර සමහරුන් එසේ නොකරයි. මිලියනපතියන් සහ බිලියනපතියන් ඒ අන්දමින් විනාශ වී යන බව ඔබට වැටහෙයි. අච්චා.

සුමිහිරි, ආදරණීය, බොහෝ කලක් නැති වී සිට දැන් හමු වුණු දරුවන්ට ඔබගේ මව, පියා, බාප්දාදා සෙනෙහසින් සිහිපත් කර සුබ උදෑසනක් ප්‍රාර්ථනා කරයි. ආධ්‍යාත්මික පියාගෙන් ආධ්‍යාත්මික දරුවන්ට නමස්කාර.

**ධාරණය සඳහා සාරාංශය:**

1. උසස් තත්ත්වයක් හිමි කරගැනීම සඳහා, ඔබගේ මුවින් ඥානයේ මිණි මුතු පමණක් මතු වීමට ඉඩ හරින්න. ඔබ උසස්ම විනය නීතීන් පිළිපදින, ශ්‍රේෂ්ඨ ජීවාත්මයක් වන ආකාරයේ එවන් සිතිවිලි, වදන් සහ ක්‍රියා සිදු කරන්න.
2. මෙම අවසන් උපතේදී පාරිශුද්ධ වීමට පොරොන්දු වන්න. පාරිශුද්ධ වීමේ මාර්ගය සෑම කෙනෙකුටම පවසන්න.

**වරදානය:** ඔබ නිති සූදානම්ව සිට ඕනෑම අවස්ථාවක ඕනෑම ප්‍රශ්නයක් සම්පූර්ණ ලකුණු සහිතව සමත් වී එමගින් සදාකාලික සතුට අත්විඳිත්වා.
නිති සූදානම්ව සිටින අයගේ ප්‍රායෝගික ස්වරූපය සැමවිටම සතුටින් සිටීමයි. ඕනෑම අවස්ථාවක් යටතේ, ස්වාභාවික විපත් හෝ ඔවුන්ගේ ශරීරයෙන් පැමිණෙන ඕනෑම කර්ම විඳවීමක් යන මෙම ප්‍රශ්න පත්‍ර සම්පූර්ණ ලකුණු සහිතව සමත් වන අය නිති සූදානම් යැයි කියනු ලැබේ. කාලය කිසිවෙකු එනතුරු බලා නොසිටින්නාක් මෙන්, ඒ ආකාරයෙන්ම, කිසිදු බාධාවකට ඔබව නැවැත්වීමට ඉඩ නොදෙන්න. මායාගේ ඕනෑම සියුම් හෝ භෞතික බාධක තත්පරයකින් අවසන් කරන්න, එවිට ඔබට සැමවිටම සතුටින් සිටීමට හැකි වනු ඇත.

**පාඨය:** ඔබේ සියලු බල නියම වේලාවට භාවිත කිරීම යනු මාස්ටර් සර්වබලධාරීවරයෙකු වීමයි.

***** ඕම් ශාන්ති *****

**අව්‍යක්ත සංඥාව: එකමුතුකම සහ විශ්වාසයේ විශේෂත්වයෙන් සාර්ථකත්වයෙන් පිරිපුන් වන්න.**

එකමුතුකම සඳහා පදනම් දෙකක් තිබේ: 1) ශ්‍රද්ධා විශ්වාසය. 2) සෙනෙහස. එකිනෙකා කෙරෙහි පැහැදිලි විශ්වාසය අඩු වීමට ඉඩ නොදෙන්න. කෙනෙකු යමක් පවසන විට, අනෙකා පිළිගනී මෙය එකමුතුකමේ නූලෙන් බැඳීමට ඇති මාර්ගයයි. ඔබේ හදවත් තුළ එකිනෙකා කෙරෙහි ඇති සෙනෙහස ඔබව සමීප කරවයි. සෑම කෙනෙකුටම පරම පියා කෙරෙහි සෙනෙහස ඇති සේම, ඒ ආකාරයෙන්ම, පවුලේ සෑම කෙනෙකුටම සැබෑ සෙනෙහසක් තිබිය යුතුය. මේ සඳහා, ඔබේ ආත්ම ගෞරවය පවත්වා ගෙන සෑම කෙනෙකුටම ගෞරව කරන්න.